## “දිවිනැගුමට - සමෘද්ධි ශක්තිය”

## අළුත් අවුරුදු උත්සවය හා ඉතුරුම් වැඩසටහන - 2013

**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ බැංකු මුල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරනු ලබන බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 17 හා 18 ට හත්වන එකතුව**

1. පාලක මණ්ඩලය,

   සමෘද්ධි බැංකු සංගමය, ...............................

2. කළමනාකරු,

   සමෘද්ධි බැංකු සංගමය, ...............................

3. සභාපති,විධායක කමිටුව,

   සමෘද්ධි මහ සංගමය, .............................

4. කළමනාකාර අධ්‍යක්ෂ,

   සමෘද්ධි මහ සංගමය, .........................................

5. මුලස්ථාන කළමනාකරු,

   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ........................................

6. ප්‍රාදේශිය ලේකම්/ නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,

   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, .......................................

7. සමෘද්ධි සහකාර කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,

   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................

8. සමෘද්ධි සම්බන්ධිකරණ නිලධාරි,

   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................

9. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................

10. ප්‍රධාන අභ්‍යන්තර විගණක,

    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

11. සාමාන්‍යාධිකාරි සහ සියළුම අධ්‍යක්ෂවරු,

    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

12. ලේකම්,

    ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,

    5 වන මහල,අංක 464, ටී.බී. ජායා මාවත,

    කොළඹ 10.

**බැංකු මූල්‍ය කටයුතු අංශය,ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය,**

**4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**

**2013.02.11**

දුරකථන අංකය:- 0112 - 873798 ෆැක්ස් අංකය :- 0112 - 869494

2013.02.11

**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරනු ලබන බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 17 හා 18 ට හත්වන එකතුව**

## "දිවිනැගුමට - සමෘද්ධි ශක්තිය"

## අළුත් අවුරුදු උත්සවය හා ඉතුරුම් වැඩසටහන - 2013

**1. හැදින්වීම.**

1.1 ශ්‍රී ලංකාවේ දුප්පත් ජනතාව සදහා 1995 වර්ෂයේ ආරම්භ කරන ලද සමෘද්ධි ව්‍යාපාරයේ මූලික අරමුණු වූයේ දුප්පත් ජනතාව ඉතිරි කිරිම සදහා පෙළඹවීම හා ස්වයංරැකියා අවස්ථා සදහා ප්‍රාග්ධන පහසුකම් සමෘද්ධි බැංකුව හරහා ලබාදීමත්වේ. ඒ අනුව වසර 17 කට අසන්න කාලයක් පුරා ඉතිරි කිරිම් ප්‍රවර්ධනය සදහා හදුන්වා දෙන ලද ප්‍රමුඛතම වැඩසටහන ලෙස අළුත් අවුරුදු ඉතුරුම් වැඩසටහන හදුන්වාදිය හැකිය.

1.2 ඒ අනුව එකම දිනයක " දිවිනැගුමට ගමේ ඉතුරුම්" යන තේමාව යටතේ "දහසක් අවුරුදු උත්සව" පැවැත්වීම මගින් එය ජාතික වශයෙන් දීප ව්‍යාප්තව පැවැත්වෙන දැවැන්තම සිංහල හා හින්දු අළුත් අවුරුදු සැණකෙලිය බවට පත්වී ඇත.

1.3 ඒ අනුව 2006 වර්ෂයේ සිට 2012 වර්ෂයෙන් තුල මෙම ප්‍රවර්ධන වැඩසටහන ඉතා සාර්ථක ප්‍රගතියක් පෙන්වා ඇති බව ඔබගේ දැනගැනීම සදහා ඉදිරිපත් කරමි.

| වර්ෂය | අනුමත තැන්පතු මුදල රු. මිලියන | අනෙකුත් තැන්පතු මුදල රු. මිලියන | මුළු තැන්පතු මුදල රු. මිලියන |
|---|---|---|---|
| 2006 | 53.5 | 86.5 | 140.0 |
| 2007 | 79.2 | 120.8 | 200.0 |
| 2008 | 127.0 | 145.0 | 272.0 |
| 2009 | 169.9 | 142.3 | 312.2 |
| 2010 | 308.1 | 202.6 | 510.7 |
| 2011 | 402.9 | 201.5 | 604.4 |
| 2012 | 624.9 | 265.7 | 890.6 |

1.4 ඒ අනුව ඉහත වගුව විශ්ලේෂණය කිරීමේදී අනුමත තැන්පතු ප්‍රමාණය මෙන්ම අනෙකුත් තැන්පතු මුදල්වලද වර්ධනයක් පෙන්නුම් කර ඇත. එසේම බැංකු සංගම් සඳහා වඩාත් වාසිදායක දිගු කාලීන තැන්පතු සඳහා වඩාත් දිරිගන්වන වර්ධනයක් ඇති කර ගැනීමට බැංකු සංගම් සමත් වී ඇති බව ද පෙනීයයි. මෙයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ සමස්ථ සමෘද්ධි කාර්ය මණ්ඩලයේ ආයෝමය ශක්තිය හා ඔවුන්ගේ අති විශිෂ්ඨ කැපවීමයි. මේ නිසා අපගේ සමෘද්ධි කාර්ය මණ්ඩලය සඳහා අපගේ ගෞරවණීය ප්‍රශංසාව මෙමගින් පළ කර සිටිමු.

1.5 ඒ අනුව මෙම වසරේ බැංකු සංගම් 1072 අතුරින් රු. 1,000,000/ ක අනුමත තැන්පතු සීමාව ඉක්ම වූ බැංකු සංගම් ගණන 155 ක් වන අතර 2011 වසරේ බැංකු සංගම් ගණන 53 කි. එමෙන්ම මෙම බැංකු සංගම් අතර රු. 5,000,000/- ක සීමාව ඉක්ම වූ බැංකු සංගම් ද දක්නට ලැබීම සතුටට කරුණක් වේ. ඒ අනුව එම බැංකු සංගම් පිළිබඳව ඔබගේ දැනගැනීම සඳහා යොමු කරමි.

| **ප්‍රාදේශිය ලේකම් කාර්යාලය** | **බැංකු සංගමය** | **අනුමත තැන්පතු මුදල රු.** |
|---|---|---|
| හික්කඩුව | ඌරවත්ත | 5,146,439/- |
| හික්කඩුව | බූස්ස | 4,586,263/- |
| වාවකච්චේරි | කයිතඩි | 4,242,867/- |
| සියඹලාණ්ඩුව | ඇතිමලේ | 4,061,862/- |
| බද්දේගම | ඇල්ලකන්ද | 3,615,355/- |

(2012 වර්ෂයේ අළුත් අවුරුදු ඉතුරුම් වැඩසටහනට අදාල සවිස්තරාත්මක වාර්තාවක් දැනටමත් ඔබ වෙත එවා ඇත.)

ඒ අනුව ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරන ලද බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 17 හා 18 හා එහි එකතුන් හි සඳහන් කරුණු පහත සඳහන් සංශෝධනයන්ට යටත්ව මෙම වසරේද ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කරනු ලැබේ.

**2. තේමාව.**

"ගමේ අයට අවුරුදු ගනුදෙනු - ගමේ සමෘද්ධි බැංකුවෙන්"

"ගමේ ඉතුරුම් දිවිනැගුමට" යන්න වේ.

**3. අළුත් අවුරුදු ගණුදෙනු සඳහා සමෘද්ධි බැංකු සංගමය විවෘත කිරිම.**

3.1 මෙවර අළුත් අවුරුදු ගණුදෙනු කිරිම යෙදී ඇත්තේ අප්‍රේල් මස 14 ඉරු දින පූර්ව භාග 7.05 ට බැවින් අළුත් අවුරුදු ගණුදෙනු සඳහා බැංකු සංගමය අප්‍රේල් මස 15 දින පෙ.ව. 9.00 ට විවෘත කළ යුතුවේ.

3.2 අවුරුදු ගණුදෙනු සදහා බැංකු සංගමය වෙත පැමිණෙන ගණුදෙනුකරුවන් වෙත සුදුසු තිළිණයක් බැංකු සංගමයේ වියදමින් ලබාදීමට අවසර දෙනු ලැබේ. එම තිළිණ ලබාදිමේදී විශේෂයෙන් බැංකු සංගමයට අවාසිදායක නොවන පරිදි අනුමත තැන්පතු මුදලට සාපේක්ෂව තිළිණ ලබාදීමට කටයුතු කළ යුතුවේ.

3.3 තිළිණ ලබාදීමේදි පහත දැක්වෙන සීමාවන් තුල කටයුතු කිරිමට වග බලාගත යුතු අතර එම සීමාවන් ඉක්මවා වැය කරනු ලැබුවහොත් ඒ සදහා කළමනාකරු පුද්ගලිකව වගකිව යුතුවේ.

***<u>සැ.යුතුය :-</u>***

මෙම කාලවකවානුව තුළ තැන්පත් කරනු ලබන අනුමත තැන්පතු මුදල අවම වශයෙන් වසරක කාලයක් ගිණුම් තුල පවත්වාගෙන යා යුතුවේ.

තිළිණ ලබාදීම සදහා පහත සදහන් සීමාව තුල රු. 100 සිට රු. 1000 ක අනුමත තැන්පතුවක් සදහා රු. 10/- ක කාසියක් ද ලබාදෙන ලෙස දන්වා සිටිමි.

| | | |
|---|---|---|
| රු. 500,000/- දක්වා | - | රු. 25,000/- |
| රු. 500,001/- සිට රු. 750,000/- | - | රු. 30.000/- |
| රු. 750,001/- සිට රු. 1000,000/- | - | රු. 45,000/- |
| රු. 1000,001/- සිට රු. 2500,000/- | - | රු. 55,000/- |
| රු. 2500,001 වැඩි | - | රු. 65,000/- |

ඊට අමතරව අපගේ චක්‍රලේඛ ලිපි අංක 17 හා 18 ට හතරවන එකතුවේ 3.2 හි අංක i, ii, iii, iv පරිදි අදාල කටයුතු සිදු කළ යුතුවේ.

3.4 අළුත් අවුරුදු ගණුදෙනු වෙනුවෙන් බැංකු සංගමය විවෘත කරනු ලබන 2013.04.15 දින බැංකු කාර්ය මණ්ඩලයට හා කේෂ්ත්‍ර නිලධාරින් සදහා විශේෂ දිනක වැටුපක් බැංකු සංගමයේ වියදමින් දැරීමට අවසර දෙනු ලැබේ. නමුත් කේෂ්ත්‍ර නිලධාරින් විසින් අළුත් අවුරුදු ගණුදෙනු කාලසීමාව තුල අනුමත තැන්පතු සදහා අවම වශයෙන් රු. 25,000/- ක මුදලක් එකතු කළ යුතුය. යන කොන්දේසියට යටත්ව මෙම ගෙවීම් කිරිමට අවසරය දෙනු ලැබේ.

මේ සම්බන්ධ අදාල ගිණුම් සටහන් ලබාදී ඇති උපදෙස් පරිදි පොදු ලෙජරයේ සටහන් තබන ලෙස දන්වමි.

**4. ඉතුරුම් ප්‍රවර්ධන සතිය - (2013.04.15- 20 දින දක්වා)**

මෙම පිළිබදව සමෘද්ධි අධිකාරියේ බැංකු මුලා කටයුතු අංශය විසින් නිකුත් කරන ලද බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි 17 හා 18 ට පස්වන එකතුවට අනුව කටයුතු කළ යුතුවේ.

## 5. සමෘද්ධි අළුත් අවුරුදු උත්සව

5.1 ජාතික වශයෙන් ඉතාමත් වැදගත් වන මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුත්තේ 2013 අප්‍රේල් 20 දින වන අතර සුදුසු පරිදි තම කලාපය තුල එක් අවුරුදු උත්සවයක් පැවැත්වීමට කටයුතු කළ යුතුවේ. මෙම දිනයට නොපවත්වන කිසිදු බැංකු සංගමයකට සමෘද්ධි අධිකාරියේ බැංකු මූල්‍ය කටයුතු අංශයෙන් ප්‍රතිපූර්ණ පදනම මත ලබාදෙන රු. 15,000/- ක මුදල ලබානොදෙන බව කාරුණිකව දන්වමි. ඊට අමතරව බැංකු සංගමයේ වියදමින් රු. 25,000/- ක මුදලක් වැය කළ හැකිය. බැංකු මූල්‍ය කටයුතු අංශය විසින්මෙම මුදල් ප්‍රතිපූර්ණය කරනු ලබන්නේ රු. 300,000/- කට වඩා අනුමත තැන්පතු රැස්කරන බැංකු සංගම් සඳහා පමණක් වන අතර එම මුදල් සීමාව ඉක්මවීමට අපොහොසත් වන බැංකු සංගම් එම වියදම තම බැංකු සංගමයේ වියදමක් ලෙස දරා ගත යුතුය.

**සැ.යුතුය ;-**

මේ පිළිබඳ ප්‍රගතිය ඇමුණුම් අංක IIIපරිදි මහා සංගමයට ලබාදී මහ සංගමය විසින් නිවැරදි ලෙස පිළියෙල කර 2013.05.10 දිනට පෙර නොඑවන කිසිදු බැංකු සංගමයක් සඳහා ප්‍රතිපූර්ණය කරනු නොලැබේ.

ඊට අමතරව 5.2, 5.3 බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 17 හා 18 ට පස්වන එකතුවට අනුව කටයුතු කළ යුතුය.

## 6. ප්‍රචාරණය.

6.1 සමෘද්ධි අළුත් අවුරුදු උත්සවයට අදාල බැනරයක් බැංකු සංගමයේ වියදමින් සකසා ගැනීමට අවශ්‍ය බලය මින් ලබාදෙනු ලැබේ. ඒ අනුව පසුගිය වසරවලදි අප විසින් ලබාදුන් බැනරයේ ප්‍රමාණයට විචිත්‍රවත් බැනරයක් වන ලෙස සකස් ගෙන බැංකු පරිශ්‍රය ඉදිරිපිට කල්වේලා ඇතිව ප්‍රදර්ශනය කළ යුතුවේ. මේ සඳහා බැංකු සංගමයකට රු. 1000/- ක උපරිමය සීමාවක් යටතේ සුදුසු මුදලක් වැය ගිණුම - උත්සව කටයුතු ගිණුම (කේත අංක 2133) හර කර ලබාගත හැකිය.

6.2 අපගේ මාධ්‍ය අංශයේ සහයෝගයෙන් අළුත් අවුරුදු වැඩසටහන අදාල ගුවන්විදුලිය සහ රූපවාහිනිය වැනි ජනමාධ්‍ය සම්බන්ධ කරගනිමින් ද පුළුල් ප්‍රචාරණයක් ලබාදීමට අපේක්ෂා කෙරේ.

## 7. කාර්ය මණ්ඩලය ඇගයීම.

පසුගිය වසරවලදී ලැබූ අත්දැකීම් හා මේ පිළිබඳව ලැබී ඇති යෝජනා හා අදහස් සලකා බැලිමෙන් අනතුරුව පහත සඳහන් ඇගයීමේ ක්‍රමවේදයක් මෙම වසරේ සිට ක්‍රියාත්මක කිරීමට අදහස් කරනු ලැබේ.

## 7.1 ජාතික මට්ටමේ ඇගයීම.

මේ සඳහා වන ප්‍රශංසා සහතික සමෘද්ධි අධිකාරිය මගින් නිකුත් කරනු ලැබේ.

<u>සැලකිය යුතුය :-</u>

මෙයට අදාල තොරතුරු ඇමුණුම් iv ට අනුව නිවැරදිව පිළියෙල කර කළමනාකාර අධ්‍යක්ෂ විසින් 2013.05.10 දිනට පෙර එවිය යුතුය. එසේ නොවන කිසිදු බැංකු සංගමයක් සඳහා ප්‍රශංසා ලිපි නිකුත් නොකරන බවත්, අදාල තොරතුරු සමෘද්ධි අධිකාරියේ බැංකු මූලා කටයුතු අංශයට ලැබුනේද යන්න විමසා බැලීම බැංකු කළමනාකරුගේ වගකීමක් ද වේ. (නිලධාරීන්ගේ නමේ මුල් අක්ෂර ඉංග්‍රීසි හෝඩියේ අක්ෂර වලින් එවිය යුතුය.)

අනුමත තැන්පතු මුදල රු. 1500,000/- වැඩි තැන්පතු එක් රැස් කරනු ලබන බැංකු සංගමය/ බැංකු සංගමයේ කාර්ය මණ්ඩලය හා කේෂ්ත්‍ර කාර්ය මණ්ඩලයේ නමින් ඇගයීම් ලිපි නිකුත් කරනු ලබන අතර, අනුමත තැන්පතු සඳහා රු. 50,000/- කට වඩා අඩුවෙන් මුදල් රැස් කරන කේෂ්ත්‍ර නිලධාරින් මෙම ඇගයීමට දායක කරගනු නොලැබේ.

අනුමත තැන්පතු සඳහා කේෂ්ත්‍රයෙන් පමණක් රු. 200,000/- හෝ ඊට වැඩි තැන්පතු රැස් කළ සමෘද්ධි නිලධාරින් ඇගයීමට අදාල තොරතුරු ද මහ සංගම් මට්ටමින් එවීම සඳහා ඇමුණුම iv ආකෘතිය භාවිතා කරන්න.

## 7.2 දිස්ත්‍රික් මට්ටමේ ඇගයීම.

මෙම ඇගයීම් ලිපි නිකුත් කිරිම දිස්ත්‍රික් ලේකම්/ සහකාර සමෘද්ධි කොමාසරිස්වරුන්ගේ අත්සනින් යුතුව සිදු කළ යුතුය.

අනුමත තැන්පතු සඳහා රු. ලක්ෂ10 - 15 අතර බැංකු සංගම්හි කළමනාකරු, කාර්ය මණ්ඩලය හා කේෂ්ත්‍ර කාර්ය මණ්ඩලය නමින් මෙම ඇගයීම් ලිපි නිකුත් කළ යුතුය. අනුමත තැන්පතු සඳහා රු.30,000/- ට වඩා අඩුවෙන් මුදල් රැස්කරණ ක්ෂේත්‍ර නිලධාරීන් මෙම ඇගයීමට දායක කර නොගත යුතුය.

අනුමත තැන්පතු සඳහා රු. 100,000 - රු. 200,000 අතර අනුමත තැන්පතු රැස් කළ කේෂ්ත්‍ර නිලධාරින් ඇගයීම.

මේ සඳහා අවශ්‍ය තොරතුරු බැංකු සංගම් මට්ටමින් ලබාගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සුදුසු වගුවක් මගින් යොමු කිරිමේ පූර්ණ වගකීම කළමනාකාර අධ්‍යක්ෂ වෙත පැවරෙන අතර, අදාල සහතික පත්‍ර සකස් කර නිලධාරින් වෙත ප්‍රදානය කිරිමේ වගකිම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමෘද්ධි බැංකු විෂයභාර කළමනාකරු වෙත පැවරේ.

## 7.3 මහ සංගම් මට්ටමේ ඇගයීම.

අනුමත තැන්පතු සඳහා රු.500,000 - 1,000,000 ත් අතර බැංකු සංගම් හී කළමනාකරු හා කාර්ය මණ්ඩලය හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය නමින් මෙම ඇගයීම් ලිපි නිකුත් කළ

යුතුයි. අනුමත තැන්පතු සඳහා රු.25,000 ට වඩා අඩුවෙන් මුදල් රැස් කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන් මෙම ඇගයීමට දායක කරගත නොගත යුතුය.

7.4 ආකාරයක්ෂම හා රාජකාරි පැහැර හරිමින් ඉතා අඩු මුදල් රැස් කරන නිලධාරින්ට ප්‍රාදේශීය ලේකම්වරයාගේ අත්සනින් යුතුව අවවාද කිරිමේ ලිපි නිකුත් කිරිම.

සමෘද්ධි වැඩසටහනේ පැවැත්ම වෙනුවෙන් තිරණාත්මක අවස්ථාවලදී පවා සුළුතරයක් වූ සමහර නිලධාරින් තම දායකත්වය ලබානොදීම ඉතා අවසානාවන්ත තත්ත්වයකි. ඔවුන්ගේ පැවැත්ම රඳා පවතින්නේ ද අනිකුත් කාර්ය මණ්ඩලය වෙහෙස මහන්සි වී ලබාදෙන දායකත්වය මතවීම වඩාත් ඛේදජනකය. එම නිසා එවැනි කාර්ය මණ්ඩලය හඳුනා ගැනීම ද, ආයතනයේ ප්‍රගතිය වෙනුවෙන් වැදගත් කාර්ය භාරයක් වනු ඇත.

මේ පිළිබඳව සලකා බලා පසුගිය වර්ෂවලදි තැන්පතු රැස් කිරිමට උනන්දුවක් නොදැක් වූ මෙන් මෙම වසරේදි ද එලෙස කටයුතු කරන නිලධාරින් හඳුනාගෙන අවවාද කිරිමේ ලිපි නිකුත් කළ යුතුය. මෙම නිලධාරින් පිළිබඳව කළමනාකාර අධ්‍යක්ෂ වෙත තොරුතුරු වාර්තා කිරිමේ වගකිම බැංකු සංගම් කළමනාකරු වෙත පැවරෙන අතර අදාල ලිපි නිකුත් කිරිම සඳහා ප්‍රාදේශිය ලේකම්වරයා සමග සම්බන්ධ වී අවශ්‍ය කටයුතු කිරිමේ වගකිම මහ සංගම් කළමනාකාර අධ්‍යක්ෂ වෙත පැවරේ මෙම ලිපි නිකුත් කිරිම ප්‍රාදේශිය ලේකම්වරයාගේ අත්සනින් යුතුව කළ යුතුය.

## 8. පොදු කරුණු

8.1 විවිධ හේතු මත 2012 වර්ෂයේ අළුත් අවුරුදු වියදම් යම් බැංකු සංගමයක් ප්‍රතිපූර්ණය නොකර තිබේ නම්, ලබාදී ඇති උපදෙස් පරිදි එය 2013 වර්ෂ අවසාන ලාභ අලාභ ගිණුමට වහාම ගැලපිය යුතුය.

8.2 අදාල පොදු ලෙජර් ගිණුම් සටහන් පැනවීමේදි පසුගිය චක්‍රලේඛ ලිපියේ හා අනිකුත් චක්‍රලේඛ මගින් ලබාදී ඇති උපදෙස් පරිදි කටයුතු කරන්න.

8.3 මේ පිළිබඳව යම් විමසිමක් සිදු කරන්නේ නම් 0112-887372 හා 0113-3106382 මගින් ඉතුරුම් ප්‍රවර්ධන අංශයේ සමෘද්ධි කළමනාකරු උදය කුමාර සොයිසා මහතා අමතන්න.

## 9. ප්‍රගතිය වාර්තා කිරිම.

9.1 සහකාර සමෘද්ධි කොමසාරිස්ගේ/ නියෝජ්‍ය දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ විශේෂ අවධානයට.

අළුත් අවුරුදු ගණුදෙනු ප්‍රගතිය සම්බන්ධව ගරු ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ දැඩි අවධානය යොමුව ඇති බැවින්, එහි ප්‍රගතිය කඩිනමින් ඉදිරිපත් කළ යුතුව ඇත. එම නිසා ඔබ කාර්යාලයේ බැංකු විෂයභාර කළමනාකරුගේ සහයෝගයෙන් සියළුම මහ සංගම් හා සම්බන්ධිකරණය වෙමින් පහත සඳහන් ආකෘතියට අනුව වඩාත් නිවැරදිව සැකසූ වාර්තාවක් 2013.04.30 දිනට පෙර අප වෙත එවිය යුතුවේ. එම එවන වාර්තාව මහ සංගම් විසින් අප වෙත එවන

තොරතුරු හා සංසදනය කිරිමේදි වැරදි බැවින් නිවැරදිව පිළියෙල කර එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ඇමුණුමI

| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය/ මහ සංගමයේ නම<br><br>1 | පැවැත් වු අවුරුදු උත්සව ගණන<br><br>2 | 2013.04.15 සිට 2013.04.20 දින දක්වා අනුමත තැන්පතු සදහා එකතුන් කළ මුදල<br><br>3 | 2013.04.15 සිට 2013.04.20 දින දක්වා අනුමත නොවන තැන්පතු සහ එකතු කළ මුදල<br>4 | මුළු තැන්පතු මුදල<br><br>3+4 |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

**9.2** **මහ සංගම් කළමනාකාර අධ්‍යක්ෂගේ විශේෂ අවධානයට.**

ප්‍රගතිය හා තොරතුරු වාර්තා කිරිමේ හා එහි නිරවද්‍යාභාවය පිළිබද පූර්ණ වගකීමක් ඔබ වෙත පැවරි ඇත. ඒ අනුව ඉහත ඡේද 7.1 හි සදහන් කාර්ය මණ්ඩලය ඇගයීම සම්බන්ධ තොරතුරු චක්‍රලේඛ ලිපි අංක 17 හා 18 ට හයවන එකතුවේ සදහන් උපදෙස් පරිදි බැංකු මුල්‍ය කටයුතු අංශය හා අදාල අංශ වෙත පහත සදහන් ඇමුණුම් හි සදහන් තොරතුරු සමග 2013.05.10 දිනට පෙර බැංකු මුල්‍ය කටයුතු අංශය වෙත එවන මෙන් දන්වා සිටිමු. වෙනත් අංශ වෙත යැවිය යුතු තොරතුරු ද එම දිනයට පෙර යැවීමට කටයුතු කරන ලෙස දන්වා සිටිනු ලැබේ.

**<u>සැලකිය යුතුය.</u>**

මෙම දිනට තොරතුරු අප වෙත එවීමට කටයුතු නොකරන කිසිම මහ සංගමයකට අදාල වියදම් ප්‍රතිපූර්ණය නොකරන අතර ප්‍රශංසා ලිපි නිකුත් නොකරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. එම බැංකු සංගම්වලට අදාල වියදම් හා වගකීම් මහ සංගමය විසින් දැරිය යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි. මෙම තොරතුරු අප වෙත 0112869494 ට ෆැක්ස් කරන ලෙසත් එම තොරතුරු ලියාපදිංචි තැපැලෙන් අප වෙත එවන ලෙසත් දන්වා සිටිමි.

9.2.1 පහත සදහන් ඇමුණුම් හී ඒ ඒ තැන්පතු සදහා බැංකු සංගමය හා ක්ෂේත්‍ර නිලධාරින් රැස් කල මුළු මුදලම දැක්විය යුතුය.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

කේ.කේ.එල්. චන්ද්‍රතිලක,
නි. අධ්‍යක්ෂ - බැංකු මුල්‍ය කටයුතු හා මහ සංගම්.

ඇමුණුම් II

| දිස්ත්‍රික්කය :............................................ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :-............................................. | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බැංකු සංගමය | කොටස් 1 | ළමා 2 | සිසුරක 3 | සමූහ 4 | එකතුව 1+2+3+4 | සාමාජික 5 | සාමා. නොව 6 | එකතුව 5+6 | මුළු එකතුව 1+2+3+4+5+6 | මුළු එකතුවට සමාන විය යුතුය | |
| | | | | | | | | | | ක්ෂේත්‍ර ලැබීම් එකතුව | ප්‍ර. කාර්යාලීය ලැබීම් එකතුව |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

අවුරුදු උත්සවය පිළිබඳ තොරතුරු

ඇමුණුම් III

දිස්ත්‍රික්කය :- .............................. ප්‍රා.ලේ.කාර්යාලය : ..............................

මහ සංගමය :-............................

| බැංකු සංගමය | අවුරුදු උත්සවය පැවැත් වූ දිනය | අවුරුදු උත්සවය පැවැත් වූ ස්ථානය | වියදම් සඳහා ඒකරාශි කරගත් මුදල | | එකතුව |
|---|---|---|---|---|---|
| | | | අනුමත ප්‍රතිපූර්ණ රු | අනුමත බැංකු | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

ඇමුණුම් IV

රු.**1,500,000** ක් හෝ ඊට වැඩි අනුමත තැන්පතු රැස්කළ බැංකු සංගම් තොරතුරු.

දිස්ත්‍රික්කය :- ...................................

| සමෘද්ධි මහ සංගමය | සමෘද්ධි බැංකු සංගමය | අනුමත තැන්පතු සඳහා බැංකු සංගමය වෙත පැමිණ තැන්පත් කළ මුදල (කොටස්+ළමා+සිසුරක+සමූහ) | අනුමත තැන්පතු සඳහා ක්ෂේත්‍රයෙන් පමණක් එකතු කළ මුදල (මෙහිදී බැංකු සංගමයේ නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ නම හා තනතුර හා එකතු කළ මුදල දක්වන්න) | |
|---|---|---|---|---|
| | | | නිලධාරියාගේ නම | එකතු කළ මුදල |
| | | | | |
| | | | | |